**ශීර්ෂය 166 - නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය නොකළ මතය**

නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව නගර සැලසුම්, ජලසම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 24 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 30 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙළ කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට **නගර සැලසුම්, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන** අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය නොකළ මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරක ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූසසන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරවු කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳ ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශ ඉකුත් වර්ෂ සමග අනුරූප වන බව

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ) බැදීම් ලේඛනය**<br>අමාත්‍යාංශයේ උසස් අධ්‍යාපන අංශය විසින් එළඹී ඇති බැදීම් සම්බන්ධයෙන් සටහන් කිරීම සඳහා බැදීම් ලේඛනයක් පවත්වා නොතිබූ අතර ඒ හේතුවෙන් ඒ ඒ බැදීම්වලට එළඹී දිනයන් හා එම බැදීම් අවසන් වන දිනයන් පැහැදිලිව තහවුරු කර ගැනීමට නොහැකි විය. | බැදීම්වලට එළඹී දිනයන් හා එම බැදීම් අවසන් වන දිනයන් පැහැදිලිව නිරූපනය වන පරිදි එළඹ ඇති බැදීම් සම්බන්ධව බැදීම් ලේඛනයක් පවත්වා ගත යුතුවීම. | බැදීම් ලේඛනයක් නඩත්තු කිරීමට තීරණය කර ඇති බව. |
| **(ආ) ඇප ලේඛනය**<br>නගර සැලසුම් හා ජල සම්පාදන අංශය විසින් මුදල් රෙගුලාසි 891 (1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරීන් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි 891 (1) සඳහන් තොරතුරු ඇතුලත් වන පරිදි ඇප තැබිය යුතු නිලධාරීන් පිළිබඳ ඇප ලේඛනයක් පවත්වා ගත යුතුවීම. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාළ නිලධාරීන්ගේ හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ලේඛනයක් සකස් කර පවත්වා ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. |

### 1.6.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **(අ)** අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (ඇ) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් පවත්වා ගෙන යනු ලබන බවටත්, ත්‍රෛමාසිකව විගණන හා කළමණාකරන කමිටු රැස්වීමේදී |

| | | | |
|---|---|---|---|
| | අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත් එවැනි සමාලෝචනයක් සිදුකල බවට ප්‍රකාශ විගණනට ඉදිරිපත් කර නොතිබුණි. | | සමාලෝචනය කිරීමටත් ඒ සම්බන්ධයෙන් විගණකාධිපති වෙත ලිඛිතව වාර්තා කිරීමටත් අවශ්‍ය පියවර ගන්නා බව. |
| (ආ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | -එම- | නිසිකලට කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත වාර්තා යැවීමටත් අභ්‍යන්තර විගණක ඒකකය නිසි සේ පවත්වා ගෙන යාම සඳහා අදාළ අංශ දැනුවත් කරන ලද බව. |

### 1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** මුදල් රෙගුලාසි 170 (2) (අ( | නගර සැලසුම්, ජල සම්පාදන අංශය සඳහා ගංවතුර ආධාර වෙනුවෙන් වර්ෂයේදී වෙනත් 2017 මිලියන .ආයතනයකින් ලැබී තිබූ රු ආදායමට බැර ග රාජ්‍යක පරිත්‍යා 10 නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබූ අතර එම මුදලින් ගංවතුර ආධාර නොවන වෙනත් 201 කටයුතු සඳහා7 සිට 2019 වර්ෂ 03 සඳහා පිළිවෙලින් රු.1,000,678 ක් රු.1,494,865 ක් හා රු.712,057 ක් වැය කොට තිබුණි. | මුදල් රෙගුලාසි 170 (2) (අ) ප්‍රකාරව මෙම මුදල් රාජ්‍ය ආදායමට බැර කළ යුතු වීම. | එකඟ වන බව. |
| (ආ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | උසස් අධ්‍යාපන අංශයට අදාළව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ භාණ්ඩ අයිතම 74 කට අදාළ ඌනතා හා භාණ්ඩ අයිතම 35 කට අදාළ අතිරික්තතා සම්බන්ධයෙන් චක්‍රලේඛ උපදෙස් | ඉන්වෙන්ට්‍රි භාණ්ඩවල ආරක්ෂාව හා පැවැත්ම තහවුරුවන පරිදි, වාර්ෂිකව භාණ්ඩ සමීක්ෂණය තුළින් | හඳුනාගන්නා ලද අතිරික්තතා හා ඌනතා ඇතිවීමට හේතු හා ඒවා නිවැරදි කිරීමට ගන්නා ලද පියවරයන් සම්බන්ධ වාර්තා |

| | | | | |
|---|---|---|---|---|
| | | අනුව කටයුතු කර නොතිබුණි. එසේම නගර සැලසුම් හා ජල සම්පාදන අංශයට අදාළව 2019 වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2020 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අනාවරණය වන ඌනතා හා අතිරික්තතා සම්බන්ධව චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු වීම. | කැඳවා ඇති බව. |
| (ඈ) | **දිනැති 28 ජුනි 2017 01 අංක/දරන 2017 මුදල් හා ජනමාධ්‍ය ශයේ අමාත්‍යාං වත්කම් කළමනාකරණ** 07 **ලේඛයේචක්‍ර** ඡේදය | නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය සතු සියලු වත්කම් සම්බන්ධ විස්තර වසරේ සිට 2018 සෑම කාර්තුවක් අවසානයේදීම කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ලබා දිය යුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව වත්කම් කළමනාකරණය සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු වීම. | එකඟ වන බව. |
| (ඇ) | **2019සැප්තැම්බර් 24 05 දිනැති අංක/ 2019 ජාතික අයවැය** 3 **ලේඛයේචක්‍ර** වගන්තිය | 2019 වර්ෂය සඳහා ප්‍රමුඛ නොවන ව්‍යාපෘතීන්, මෙතෙක් ආරම්භ කර නොමැති අය වැය යෝජනාවල ඇතුළත් ව්‍යාපෘති හා අත්‍යාවශ්‍ය නොවන ගෘහභාණ්ඩ, කාර්යාල උපකරණ ආදී අයිතමයන් මිලදී ගැනීම පිළිබඳව හඳුනාගැනීමටත් එම කාර්යයන් ඉදිරි වර්ෂය තෙක් කල් දැමීම කෙරෙහි අවධානය යොමු කරවනු ලබන බවත් දක්වා තිබියදීත් ව්‍යාපෘති 10 ක් සඳහා 2019 සැප්තැම්බර් මාසයෙන් පසුව නගර සැලසුම් අංශය විසින් රු.මිලියන 19.9 ක් වටිනා ව්‍යාපෘති වෙනුවෙන් ගිවිසුම්වලට එළඹ තිබුණි. | චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතු වීම. | මහජන අවශ්‍යතාවයන් ඉටු කිරීමේදී රජය කෙරෙහි විශ්වාසය තහවුරු කිරීමට ඉතා අත්‍යාවශ්‍ය වන මෙම ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට සිදු වූ අතර විශේෂයෙන් දුෂ්කර ප්‍රදේශ වල තිබෙන අබලන් තත්වයේ තිබූ අභ්‍යන්තර මාර්ග කිහිපයකට ප්‍රමුඛතාවය දී එම ව්‍යාපෘතීන් සඳහා ගිවිසුම් අත්සන් කර ඇති බව. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් සමාලෝචනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වාර්ෂික ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසා තිබූ වැය විෂයයන් 13 කට අදාළ රු.මිලියන 1,485 ක ප්‍රතිපාදනවලින් කිසිදු මුදලක් උපයෝජනය කර නොතිබුණි. | ආයතනයේ අරමුුණු හා පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා සලසා ඇති ප්‍රතිපාදන උපරිම අයුරින් උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුවීම. | විවිධ වූ හේතු මත සමාලෝචිත වර්ෂය තුළ මෙම සම්පූර්ණ ප්‍රතිපාදන ඉතිරිවීම නොවැළැක්විය හැකි වූ බව. |
| (ආ) | අමාත්‍යාංශය යටතේ වූ කුලියාපිටිය මහාචාර්ය ඒකකය ඉදිකිරීමේ ව්‍යාපෘතිය වෙනුවෙන් පරිපූරක ඇස්තමේන්තු මඟින් වෙන් කර ගන්නා ලද රු. මිලියන 150 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | නිශ්චිත අරමුණක් ඉටුකර ගැනීම සඳහා වෙන් කර ගන්නා ලද ප්‍රතිපාදන උපයෝජනය කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතු වීම. | රු.මිලියන 150 ක් වූ කුලියාපිටිය මහාචාර්ය ඒකකය ඉදිකිරීම සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත පැවරීම හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි වූ බව. |
| (ඇ) | වැය විෂයයන් 32කට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. මිලියන 5,445 ක් ඉතිරිවීම් වූ අතර එය සියයට 33 සිට සියයට 99 දක්වා පරාසයක පැවතුණි. | ප්‍රතිපාදන උපරිම ලෙස උපයෝජනය කිරීමට කළමනාකරණය කටයුතු කළ යුතු වීම. | අක්මුදල් නොලැබීම, ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමයට ප්‍රමාණවත් ළමුන් සංඛ්‍යාවක් නොපැමිණීම, ඉදිකිරීම් කටයුතු අතරමග නවතා දැමීම, කොන්ත්‍රාත් සඳහා අනුමැතිය ලැබීම ප්‍රමාදවීම, අදාළ කොන්ත්‍රාත්කරුවන් නිසි කාලය තුළ බිල්පත් ඉදිරිපත් නොකිරීම, වියදම් කළමනාකරණය කර ගැනීමට හැකිවීම හා නඩත්තු වියදම් අඩුවීම යන කාරණා හේතුවෙන් මෙම ප්‍රතිපාදන ඉතිරි විය. |

**2.2** **බැරකම් හා බැඳීම්වලට එළඹීම.**

**--------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | -------------- | -------------------------------- |
| **(අ)** | 2017 අප්‍රේල් 21 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයට හා මුදල් රෙගුලාසි අංක 94 ට පටහැනිව වර්ෂය අවසානයට වූ වැය විෂයයන් 12 කට අදාළ බැරකම්වලට අදාළ ඉතිරිය ගැලපීම් කිරීමෙන් පසුව ශුද්ධ ප්‍රතිපාදනය ඉක්මවා එකතුව රු.මිලියන 10.9 ක බැරකම්වලට බැඳී තිබුණි. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි උපදෙස්වලට අනුකූල ලෙස කටයුතු කළ යුතු වීම. | ඉදිකිරීම් කටයුතු සිදුකර රු.මිලියන 8.6 ක බිල්පත් ඉදිරිපත් කිරීම හේතුවෙන් හා රු.මිලියන 2.3 ක බැරකම් කල්දැමිය නොහැකි ස්වභාවයේ වියදම්වලට ගෙවීම් බව. |
| **(ආ)** | 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 3.4 වගන්ති අංක (iii) ට අනුකූල වන පරිදි මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණික ආයතනය සංවර්ධනය කිරීමේ හා ප්‍රතිස්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා පෞද්ගලික බැංකු දෙකකින් ලබා ගෙන තිබූ ණය මුදල වෙනුවෙන් 2020 වර්ෂයේදී ගෙවිය යුතු රු.මිලියන 344.9 ක පොලී මුදල, බැරකම් හා බැඳීම් ප්‍රකාශයෙන් හෙළිදරවු කර නොතිබුණි. | සියළු බැරකම් හෙළිදරවු කළ යුතු වීම. | මෙම ණය මුදල සඳහා පොලී ගණනය කිරීම බර තැබූ සාමාන්‍ය අනුපාතය මත සිදු කෙරෙන බැවින් හා පොලී ප්‍රමාණය නිශ්චිත නොවූ බැවින් ගෙවිය යුතු ණය වාරිකයේ ප්‍රාග්ධන කොටස පමණක් බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ හෙළිදරවු කර ඇති බව. |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂනයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2017 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 262/2017 ට අනුව විශ්‍රාම ගිය නිලධාරීන්ගේ ණය ශේෂ සම්බන්ධයෙන් කටයුතු නොකිරීම මත වර්ෂ 2 කට වැඩි කාලයක සිට විශ්‍රාමලාභියෙකුගෙන් රු. 83,920ක ණය ශේෂයක් අය නොවී පැවතුණි. | අදාළ චක්‍රලේඛ විධිවිධානවලට අනුව කටයුතු කර හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | විශ්‍රාම පාරිතෝෂිතයෙන් අයකර ගැනීමට කටයුතු කරමින් පවතින බව. |
| (ආ) ණය ශේෂ කපා හැරීම සම්බන්ධයෙන් 2017 මාර්තු 13 දිනැති අංක PF/RED/2015/රනිඅබි/05 දරන රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියෙන් තවදුරටත් ගත යුතු ක්‍රියාමාර්ග දන්වා තිබුණ ද 2006 වර්ෂයේදී සහ 2015 වර්ෂයේදී සේවය හැරගොස් තිබූ නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.231,450 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අය නොවී පැවතුණි. | චක්‍රලේඛ උපදෙස් පරිදි ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවීම. | දේපල ණය අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය කටයුතු සිදුකරමින් පවතින අතර සේවය හැරගොස් තිබෙන නිලධාරීන්ගේ ණය කපාහැරීම සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතින බව. |

## 2.4 තැන්පතු ශේෂයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2013 වර්ෂයේ සිට 2018 කාලපරිච්ඡේදය තුළදී උසස් අධ්‍යාපන ආයතන සමාලෝචනය සඳහා රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන 51 කින් අයකර ගෙන තිබූ එකතුව රු.24,073,406 ක් වූ තැන්පතු මුදල් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි. | උපාධි ප්‍රදාන ආයතනයන්හි ඉල්ලීම් මත සමාලෝචන කාර්යයන් ප්‍රමාදයකින් තොරව ඉටුකර තැන්පතු මුදල් රාජ්‍ය ආදායමට බැර කළ යුතුවීම. | සමාලෝචන කටයුතු සිදුකිරීමට දීර්ඝ කාලයක් ගතවන හෙයින් කාර්යය අවසන් වනතුරු පොදු තැන්පත් ගිණුමෙහි රඳවා ගැනීමට කටයුතු කර ඇත. දැනට කටයුතු අවසන් කර ඇති ආයතනවලට අදාළ තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමට තීරණය කර ඇති බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 571(2) ප්‍රකාරව 21 පන වන සියවස සඳහා වූ උසස් අධ්‍යා වර්ෂයේ 2016 ඝෘතියට අදාළවව්‍යා ක් 02 සිට ඉදිරියට ගෙනවිත් තිබූ වර්ෂ .ඉක්මවූ රු මිලියන 5.5 ක තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම පොදු තැන්පත් ගිණුමෙහි රඳවා ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වර්ෂ 02 ඉක්මවූ රැඳවුම් මුදල් රාජ්‍ය ආදායමට බැර කළ යුතුවීම. | වර්ෂ 02 ක් ඉක්මවා ඇති තැන්පතු රාජ්‍ය ආදායමට බැර කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 දැක්ම හා මෙහෙවර**

---------------------

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| 2014 පෙබරවාරි 14 දිනැති අංක **PFD/RED/01/04/2014/01** දරන භාණ්ඩාගාර ලේකම්වරයාගේ චක්‍රලේඛයේ 03 ඡේදයෙහි තොරතුරුවලට අනුකූලවන පරිදි අමාත්‍යාංශයට අදාළ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කර නොතිබුණි. | අදාළ චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙළ කළ යුතුවේ. | ඉදිරියේදී සියළුම වාර්තා ක්‍රියාකාරී සැලැස්ම සමග ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලබන බව. |

**3.2 සැලසුම් කිරීම**

----------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| **(අ)** | අමාත්‍යාංශයේ ඇති කර ගෙන ඇති අරමුණුවලට ලඟා විය හැකි අයුරින් ඒක් එක් අරමුණට අදාළව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ක්‍රියාකාරකම් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර එක් එක් වර්ෂය ආරම්භවීමට පෙර එම සැලැස්ම අනුමත කර ගත යුතුය. එසේ වුවද 2019 අගෝස්තු 30 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ ක්‍රියාකාරකම් ඉටුකිරීම තුළින් ලඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු හඳුනා ගෙන නොතිබූ අතර එසේ අරමුණු ඇතුළත්ව | ක්‍රියාකාරී සැලැස්ම ක්‍රි යාකාරී වර්ෂය ආරම්භ වීමට පෙර පිළියෙළ කර අනුමත කරවා ගත යුතු වේ. | 2019 වර්ෂයේදී ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී ආකෘතියේ වෙනස්වීමක් සිදුකර තිබූ බැවින් අරමුණු ඇතුළත් කර නොතිබූ අතර අනතුරුව එම අරමුණු ද ඇතුළත් කර සැලැස්ම සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇති බව. |

| | | |
|---|---|---|
| පිළියෙළ කරන ලද ක්‍රියාකාරි සැලැස්ම පිළියෙළ කිරීම 2020 ජුනි මස දක්වා ප්‍රමාද කර තිබුණි. | | |
| (ආ) 2017 වර්ෂයේ ආරම්භ කර 2021/2022 වර්ෂවලදී සම්පූර්ණ කළ යුතු කාර්යයන්වල ඉලක්කයන් 2019 වර්ෂයේ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර නොතිබුණි. | අදාළ වර්ෂය තුළ දී ඉටුකිරීමට යෝජිත කාර්යයන් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | කාලය දීර්ඝ කිරීමට යටත්ව අයවැය වෙන් නොකිරීම හේතුවෙන් ඊළඟ වසරේ ක්‍රීයාකාරී සැලැස්ම සඳහා ඇතුළත් නොකිරීමට පියවර ගෙන ඇති බව. |

## 3.3 කාර්යභාරයන් ඉටු නොකිරීම

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2018/2019 වර්ෂයන්හි අයවැය යෝජනා මත ක්‍රියාත්මක කරන ලද එකතු වටිනාකම රු.මිලියන 27,348 ක් වූ ව්‍යාපෘති 06 ක මූලික ප්‍රසම්පාදන කටයුතු සිදුකිරීම, අදාළ කොන්ත්‍රාත්කරු තෝරා ගැනීම, ණය ගිවිසුම්වලට එළඹීම ආදී කටයුතුවල සිදුවූ ප්‍රමාදයන් හේතුවෙන් අපේක්ෂා කළ කාලය තුළ අදාළ ව්‍යාපෘති ඉලක්කයන් ලබා කර ගෙන නොතිබුණි. | වාර්ෂික අයවැය යෝජනා යටතේ අනුමත වූ නියමිත මුදල් වර්ෂයට අදාළ ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත් කර ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති නිමකිරීමට කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයේ අමාත්‍යාංශ විෂය පථය වෙනස්වීමෙන් ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද වීමට හේතුවීම, අදාළ ඉඩම් නිරවුල් කර ගැනීමේ හේතුවෙන් කොන්ත්‍රාත්තු පිරිනැමීම ප්‍රමාදවීම ආදිය ව්‍යාපෘති ප්‍රමාදයන්ට හේතුවී ඇති බව. |
| (ආ) ශයේවර්ෂයේ අමාත්‍යාං 2019 ක්‍රියාකාරී සැලැස්ම මඟින් ජල සම්පාදන හා සනීපාරක්ෂක කටයුතු වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ බදුල්ල හල්දුම්මුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රුක 160 මිලියන. .තිපාදන ලෙස සලසා ගෙන තිබුණිමුදලක් ප්‍ර කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළදී .එයින් රුමිලියන 3.ක වියදම් සඳහා දරා 6 ත් පෘතියට අදාළ කොන්ත්‍රාතිබුණු අතර ව්‍යා දානයට සමාලෝචිත වරප‍්‍රෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ. | දැනට සැලසුම් හා ක්‍රමසම්පාදන කටයුතු අවසන් කර ඇත. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ තීරණයකට අනුව සැලසුම වෙනස් කර නැවත අධ්‍යනයක් සිදු කර ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කිරීමට නියමිත බව. |

**3.4 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

**-----------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අමාත්‍යාංශ අධීක්ෂණය යටතේ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මඟින් දැනට ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති 14 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේදී ක්‍රියාකාරි සැලැස්ම අනුව ලගා කර ගත යුතු අපේක්ෂිත භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය සියයට 22 ත් සියයට 100 ත් අතර පරාසයක පැවතිය යුතු වුවත්, ලඟා කර ගෙන තිබූ භෞතික ප්‍රගතිය සියයට 10 ත් සියයට 86 ත් දක්වා වූ පරාසයක පැවතුණි. | අපේක්ෂිත ප්‍රගතිය ලබා ගැනීමට ක්‍රියා කළ යුතු වේ. | විසල් මාතලේ ජල සැපයුම් ව්‍යාපෘතිය සඳහා අවශය ජල නල හා උපාංග වරායෙන් නිදහස් කර ගැනීමට ප්‍රමාදවීමත් ගෙවිය යුතු බිල් සඳහා නියමිත දින දී මුදල් ගෙවා නොතිබීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු වැඩ ප්‍රමාද කළ බව. |
| (ආ) අමාත්‍යාංශය විසින් සෘජුව ක්‍රියාත්මක කරන ලද හා සමාලෝචිත වර්ෂය තුළ නිම කළ යුතුව පැවති කාලීන වකුගඩු රෝග නිවාරණ වැඩසටහනමීය ජල සම්පාදන හා ග්‍රා , සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීමේ සනීපාරක්ෂාව පිළිබඳ දකුණු ,ෘතියව්‍යා වැසි ජල ටැංකි ඉදිකිරීමේ ,ආසියානු සමුළුව වැඩසටහන හා කලාපීය සනීපාරක්ෂක ස්ථාන ස්ථාපිත කිරීමේ වැඩසටහන මධ්‍ය සමාලෝචිත වර්ෂය අවසානය වන විට අපේක්ෂිත පරිදි නිම කිරීමට නොහැකි වී තිබුණි. | අපේක්ෂිත ප්‍රගතිය ලබා ගැනීමට ක්‍රියා කළ යුතු වේ. | වැඩ ආරම්භ කිරීම ප්‍රමාදවීම, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කරන ලද බිල්පත් සඳහා නියමිත වේලාවට මුදල් නොගෙවීම නිසා වැඩ ඉටුකිරීම ප්‍රමාදකිරීම හා අතහැර දැමීම හේතුව වූ බව. එසේම මුදල් අමාත්‍යාංශයේ 2019.09.24 දිනැති අංක 5/2019 දරණ ජාතික අයවැය චක්‍රලේඛයෙන් සැලසුම් කල සමහර වැඩසටහන්වල ප්‍රසම්පාදන කටයුතු ඉදිරියට සිදු නොකිරිමට උපදෙස් ලැබීම නිසා ක්‍රියාකාරකම් නැවැත්වීමට ද සිදු වූ බව. |

## 3.5 ව්‍යාපෘති නිම නොකර අත්හැරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අමාත්‍යාංශය යටතේ ඇති නගර සැලසුම් අංශය විසින් වර්ෂය තුළ 2019 ක් ආවරණය වන පරිදි 16 ක්කදිස්ත්‍රි යාත්මකක්‍රිකර තිබූ ව්‍යාපෘති 248න් ව්‍යාපෘති ක් හෙවත් සියයට 17169 කට ආසන්න ව්‍යාපෘති ප්‍රමාණයක් උතුරුඋතුරු මැද හා , දේශවලට පමණක් සීමා වී නැගෙනහිර ප්‍ර තිබුණි. අම්පාර හා නුවරඑළිය දිස්ත්‍රික්කයන් තුළ 2016 සිට වර්ෂ 2018 තුළදී ආරම්භ කරන ලද ව්‍යාපෘති ක වැඩ කටයුතු 04 සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අතරමග නවතා දමා තිබුණි . | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති කටයුතු නිම කල යුතු වේ. | 2019 වසර තුළ ව්‍යාපෘතීන්ගෙන් සියයට 70 ක් පමණ උතුරු, උතුරු මැද හා නැගෙනහිර ප්‍රදේශයන්ට සීමාවීමට, 2019 අයවැය යෝජනා මූලිකව හේතු වී තිබුණි. එසේම 2019 වසරේ අගෝස්තු මාසය වන තෙක් වෙනත් අරමුදල් නොලැබීමෙන් 2018 වසරේ නිම නොකරන ලද ව්‍යාපෘතීන් 2019 වසර තුළදී නිම කිරීම සඳහා පමණක් මූලිකව මුදල් වෙන් කිරීමත්, 2019 වර්ෂයේ වෙන් කළ අතිරේක ප්‍රතිපාදනවලින් සියයට 50 ක් පමණ උතුරු, උතුරු මැද හා නැගෙනහිර පළාත් සඳහා වෙන් කිරීමට ද හේතු වූ බව. |

## 3.6 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) කැලණිය විශ්වවිද්‍යාලයේ රු.මිලියන 250 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත ක්‍රියාත්මක කෙරෙන විද්‍යුත් ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය සඳහා නිම කළ යුතු දිනය වනිශ්චිත දැක්වීමකින් තොරව ව්‍යාපෘති කාලය 2017/2018 වර්ෂය ලෙස තීරණය කර තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ව්‍යාපෘතිය වෙනුවෙන් රු.මිලියන 39 ක ප්‍රතිපාදන පමණක් උපයෝජනය කර තිබූ අතර ඊට සාපේක්ෂව ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය ඉතා අඩු මට්ටමක පැවතුණි. මෙසේ කාලය දීර්ඝ කිරීම හේතුවෙන් ව්‍යාපෘතිය සඳහා යොදවන තාක්ෂණ සම්පත්වල යල්පැනීම සහ මිල | ව්‍යාපෘතිය සැලසුම් කිරීමේදී ශක්‍යතා අධ්‍යයන වාර්තා නිර්දේශ සැලකිල්ලට ගෙන සලසා ගත හැකි ප්‍රතිපාදන නිශ්චය කර නිශ්චිතව නිම කළ යුතු ඉලක්කයන් තීරණය කළ යුතු අතර ව්‍යාපෘති කාල දීර්ඝ කිරීම් ලබාදීමේදී ද තාක්ෂණික සම්පත්වල ඵලදායී ජීවිත කාලය සැලකිල්ලට ගෙන කටයුතු කළ යුතු වේ. | අවශ්‍ය ලෙස ප්‍රතිපාදන වෙන් නොකිරීම හේතුවෙන් ව්‍යාපෘතියෙහි අපේක්ෂිත අරමුණු සියල්ල ඉටුකර ගැනීමට නොහැකි වුවද, ඉටුකල ක්‍රියාකාරකම්හි ප්‍රතිඵලයක් ලෙස දැනටමත් අධ්‍යයන ක්ෂේත්‍රයෙහි යොදා ගනිමින් සිටින e-නිපැයුම් කිහිපයක් වේ. |

| | | | |
|---|---|---|---|
| | ගණන්වල වැඩිවීම ව්‍යාපෘතිය කෙරෙහි අහිතකර ලෙස බලපෑ හැකි බව නිරීක්ෂණය විය. | | |
| (ආ) | ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 1,180 ක් වූ රුහුණු විශ්වවිද්‍යාලයේ මහල් 12 කින් යුත් වෛද්‍ය පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2018 මුල් කාර්තුව තුළ ආරම්භ කර තිබූ අතර ඒ වෙනුවෙන් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ලෙස 2018 ජනවාරි 17 දින රු.මිලියන 200 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි. මෙම ව්‍යාපෘතිය 2019 සැප්තැම්බර් 30 දින වනවිට නිම කළ යුතු විය. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රගතිය රු.මිලියන 299 ක් පමණක් වූ අතර භෞතික ප්‍රගතිය සියයට 19 ක් වැනි පහළ මට්ටමක පැවතුණි. ඒ අනුව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල අවකරණය කිරීමට තරම්වත් ප්‍රමාණවත් වැඩ කොටසක් නිම කර නොතිබුණි. | කොන්ත්‍රාත්කරුවන්ගේ පූර්ව ව්‍යාපෘති නිම කිරීමේ කාර්යසාධන ප්‍රගතිය ඇගයීම සිදුකර කොන්ත්‍රාත්කරුවන් තෝරා ගත යුතු වේ . | විවිධ හේතූන් මත එකී සමාගමෙහි කටයුතු අඩාල වී තිබූ අතර මෙම ඉදි කිරීම් ද මන්දගාමීව සිදු කිරීම හේතුවෙන් එම කොන්ත්‍රාත්කරු සමග එළඹ තිබූ ගිවිසුම අහෝසි කිරීමට පියවර ගනු ලැබූ බව හා අමාත්‍ය මණ්ඩල අනුමැතිය පරිදි මෙම ඉදිකිරීම CECB සමාගම වෙත පවරා ඇති බව. |
| (ඇ) | ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් ක්‍රියාත්මක කරන ලද එකතු වටිනාකම රු.මිලියන 119,544 ක් වූ ව්‍යාපෘති 08 ක් කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනයඉඩම් නිරවුල් , ත් කොන්ත්‍රා ,මාදයන්කර ගැනීමේ ප්‍ර ප්‍රදානය කිරීමේ ප්‍රමාදයන්පාරිසරික හා , මාදයන්නැවත පදිංචි කිරීමේ ප්‍ර යනාදි හේතු නිසා සැලසුම් කළ දිනය ඉක්මාව දින 184 සිට දින 1825 දක්වා කාල පරාසයක ප්‍රමාද වී තිබුණු අතර එම ව්‍යාපෘති නිමකිරීම සඳහා කොන්ත්‍රාත් කාලසීමාව ඉක්මවාද දින දීර්ඝ කිරීම් ලබා දී තිබුණි. | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. | ව්‍යාපෘති කටයුුතු ආරම්භ කර ක්‍රියාත්මක කරගෙන යාමේදී ඇතිවූ විවිධ ගැටළු ව්‍යාපෘති ප්‍රමාදයට හේතු වූ බව. |
| (ඈ))i) | වර්ෂවලදී 2018 සහ 2017ජල සම්පාදන හා සනීපාරක්ෂක කටයුතු වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන රු3 මිලියන.,630.ක 41 පිරිවැයකින් යුත්නාගරික ජල සම්පාදන ව්‍යාපෘති 04 ක් ආරම්භ කර තිබූ අතර එයින් ව්‍යාපෘති 2019 ක කටයුතු 03 එක් ,වර්ෂයේ ද ව්‍යාපෘතියක ඉදිකිරීම් කටයුතු දින වන විට 01 ජනවාරි 2020 එසේ වුවද .අවසන් කළ යුතුව තිබුණි දින 31 මැයි 2020වන විටත් එකී | සැලසුම් කළ පරිදි ව්‍යාපෘති නිම කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. | Covid – 19 වසංගත තත්ත්වය, රජය විසින් පනවා ඇති ආනයන භාණ්ඩ තහනම හේතුවෙන්ජල නල උපාංග , ආදිය වැඩ අවසන් කිරීම පිණිස ලබා ගත නොහැකි වීම , ත්කරුවන්ගේ ධාරිතාවය කොන්ත්‍රා ,අඩුවීම2019 අප්‍රේල් මස වන දින 21 හාරයසිදුවූ පාස්කු ප්‍රහා මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම මේ සඳහා හේතු වී තිබූ බව . |

| | | | |
|---|---|---|---|
| | කොන්ත්‍රාත්හි 04 ඉදිකිරීම් කාලයෙහි දින දක්වා කාල 415 සිට දින 150 මාදයක්පරාසයක ප්‍රසිදුවී තිබුණි . | | |
| **(ii)** | ඇස්තමේන්තු වටිනාකම රු මිලියන . 608.ක 5 මුලන්කාවිල් ජල සම්පාදන ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා 2018 ත්තුව දින කොන්ත්‍රා 08 අගෝස්තු කින් නිම 09 පිරිනමා තිබූ අතර එය මාස ත්තුව කොන්ත්‍රා .කළ යුතුව තිබුණි පිරිනැමීමෙන් පසු යෝජිත ජල යන්මූලාශ්‍රගෙන් ජලය ලබා ගැනීමට ප්‍රදේශවාසීන් එරෙහි වීම හේතුවෙන් මාස ය වෙනස් කට පසු ජල මූලාශ්‍ර 04 31 මැයි 2020 කිරීමට සිදුව තිබුණු අතර ත් පෘතියෙහි කොන්ත්‍රාදින වන විට ව්‍යා කාලය අවසන් වී වසරකට වඩා වැඩි ගතිය කාලයක් ගත වී ඇතත් භෞතික ප්‍ර .ක් පමණක් වී තිබුණි 50 සියයට | - එම - | 2020 ඔක්තෝබර් වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබූ බව. |
| **(iii)** | ඇස්තමේන්තු ගත වටිනාකම රු මිලියන. 733. 75ක් වූ මුලතිව් ජල සම්පාදන ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා ල්අප්‍රේ 2018 ත්තුවක් පිරිනමා තිබූ දින කොන්ත්‍රා 09 2019 කින් එනම් 11 අතර එය මාස දින අවසන් කළ යුතුව 11 ල්අප්‍රේ .තිබුණි2020 මැයි දින වන විටත් 31 ක් 85 ත්තුවෙන් සියයටකොන්ත්‍රා .පමණක් නිම කර තිබුණි | - එම - | 2020 ඔක්තෝබර් වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇති බව. |
| **(iv)** | වර්ෂයේ සිට 2017ආරම්භ කරන ලද කොන්ත්‍රාත් වටිනාකම රු. මිලියන 881.7 ක් වටිනා ව්‍යාපෘති කින් 49 කෙරීගෙන ව්‍යාපෘති 19 හි සැලසුම් කළ දින ඉක්මවා දින 83 සිට දින 271 දක්වා කාලපරාසයක ප්‍රමාදයක් සිදුවී තිබුණි. | - එම - | නියමිත කාලය තුල අවශ්‍ය උපකරණ ලබා ගැනීමට නොහැකි වීම, කොන්ත්‍රාත්කරුට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම මෙන්ම කම්කරුවන් රඳවා තබා ගැනීම අපහසුවීම හා ප්‍රජා මූල සංවිධානවල දායක මුදල වන සියයට 30 අයකර ගැනීමට අපොහොසත්වීම යන කරුණු හේතුවෙන් මෙම කොන්ත්‍රාත්වල තරමක ප්‍රමාදයක් පැවති බව. |
| **(ඉ)** | හම්බන්තොට අන්දරගස්යාය භූගත ටැංකියේ සිට ගන්නොරුව දක්වා ජල නල එළීම අදියර -II ව්‍යාපෘතිය සඳහා 2015 හා 2016 වර්ෂයන්හිදි පරිපූරක ඇස්තමේන්තු මඟින් ලබා ගත් රු.මිලියන 314.9 ක ප්‍රතිපාදන සම්පූර්ණයෙන් එම ව්‍යාපෘති සඳහා භාවිතා කර නොතිබුණි. තව ද හා 2017 මිලියන .වර්ෂවලදී පිළිවෙලින් රු 2018 | විධිමත්ව සැලසුම් පිළියෙල කර ඒ අනුව ප්‍රතිපාදන ලබා ගෙන ව්‍යාපෘතිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතු වේ. | ව්‍යාපෘතිය ආරම්භයේදී හඳුනාගත් සියලුම කටයුතු 2019.10.දින 23 .අවසන් වී ඇත2019 වර්ෂයේදී බඳගිරිය ආශ්‍රිතව හඳුනාගත් ප්‍රදේශ වල තවදුරටත් ජල නල දීර්ඝ කිරීමට හා ජල සම්බන්ධතා ලබාදීම සඳහා 2019 තිපාදනවර්ෂයේදී ලබාදී තිබුණ ප්‍රයොදා ගැනීමට තීරණය කරන ලද බව . |

| | | | |
|---|---|---|---|
| | ක 20 මිලියන .ක් හා රු 70 තිපාදනඇස්තමේන්තු ප්‍රමගින් ලබාගත් එකතුව රු.මිලියන 90 න් රු.මිලියන 73 ක් භාවිතා කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා ද ඇස්තමේන්තු ප්‍රතිපාදන රු .මිලියන ක් සලසා ගෙන 50 රු11 මිලියන ..ක් පමණක් වියදම් කර 8 .තිබුණිඑසේම මෙම ව්‍යාපෘතිය 2017 පෙබරවාරි මස ආරම්භ කර 2018 ජුනි වනවිට නිම කළ යුතුව තිබුණ ද 2020 දෙසැම්බර් දක්වා තවදුරටත් දින දීර්ස කිරීම් ලබා දී තිබුණි. | | |
| (ඊ) | කැගල්ල දිස්ත්‍රික්කයේ නැවත පදිංචි කිරීමේ ගම්මානවල ජල සැපයුම් පහසුකම් ලබා දීමේ ව්‍යාපෘතිය සඳහා 2017හා 2018 වර්ෂන්හීදී එකතුව රු මිලියන.355 ක ප්‍රතිපාදනයෙන් රු මිලියන.121 ක් පමණක් වියදම් කර තිබුණිසමාලෝචිත වර්ෂයේ .දීද මේ සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන රු99 මිලියන..ක් හා පරිපූරක 6 ක් 87 මිලියන.තිපාදන රුප්‍රවශයෙන් ශුද්ධ ප්‍රතිපාදනය රු186 මිලියන ..ක් 6 51 මිලියන .වූ අතර වියදම රු.ක් වී 7 .තිබුණි එසේම මෙම ව්‍යාපෘතිය 2017 මාර්තු මස ආරම්භ කර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට නිම කළ යුතුව තිබුණ ද 2021 ජුනි දක්වා තවදුරටත් දින දීර්ස කිරීම් ලබා දී තිබුණි. | - එම - | ප්‍රතිපාදන ලැබීමේ ප්‍රමාදය හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන්ගේ බිල් නිරවුල් කිරීමට නොහැකි වූ අතර එය කොන්ත්‍රාත්කරුවන්ගේ ඉදිකිරීම් කටයුතු මන්දගාමී වූ බවත් ඒ අනුව මෙම ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචි කිරීමේ ගම්මාන ක් සඳහා ලැබී ඇති 15 මූල්‍යප්‍රතිපාදන අනුව මෙම වසර අවසානයේ වැඩ නිම කිරීමට තීරණය වූ බව. |

**3.7 විදේශ ආධාර ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සුනාමියෙන් හානියට පත් පළාත්වල පිහිටි විශ්වවිද්‍යාලයන් ප්‍රතිසංස්කරණය හා නැවත ඉදිකිරීමේ ව්‍යාපෘතියට අදාළ අංක 711 දරන ණය ගිවිසුම් යටතේ ලබා දී තිබූ ණය මුදලින් තවදුරටත් ඉතිරිව ඇති කුවේට් ඩිනාර් 231,626ක ශේෂයට අදාළව ක්‍රියාත්මක කෙරෙන මෙම ව්‍යාපෘතියේ තෙවන අදියරේ කාර්යයන් | විදේශ ණය ආධාර හෝ ප්‍රදාන යටතේ ක්‍රියාත්මක වන විදේශ ආධාර ව්‍යාපෘති ආරම්භ කර ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති කාලරාමුව තුළ අදාළ නිමකිරීම් ඉලක්කයක් ලබා කර | දැනට ක්‍රියාකාරකම් 02 ක් අවසන් කර ඉතිරි ක්‍රියාකාරකම් 03 සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර වැඩ කර ගෙන යනු ලැබේ. 2020.01.22 දින ඉදිරිපත් කර ඇති රුපියල් මිලියන 23.5 ක් වටිනා බිල්පත් ප්‍රතිපූරණය |

| | | | |
|---|---|---|---|
| | සමාලෝචිත වර්ෂය අවසන් වනවිට නිම කිරීමට නියමිතව තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසන් වන විට ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය සියයට 47ක් වැනි පහළ මට්ටමක පැවතුණි. | ගැනීමට කටයුතු කළ යුතු වේ. | කර නොමැති වීම නිසාත් 2020 වර්ෂය සඳහා මෙතෙක් ප්‍රතිපාදන ලබා නොදීමත් හේතුවෙන් කොන්ත්‍රාත්කරුව--න් වැඩ මන්දගාමීව සිදුකරමින් පවතී. |
| **(ආ)** | යුනිසෙෆ් ආධාර යටතේ ක්‍රියාත්මක කෙරෙන ස්ත්‍රී පුරුෂ සමජභාවයේ/සමානතාව සාධාරණත්වය පිළිබඳ මධ්‍යස්ථානයක් ඇති කිරීම හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය හා නවක වදය වැළක්වීම පිළිබඳ ව්‍යාපෘතියේ දෙවන අදියර 2019 පෙබරවාරි 01 දින සිට ජූලි 31 දින දක්වා මස 06ක කාලපරිච්ඡේදයකින් නිම කළ යුතුව තිබුණි. නමුත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් දෙවන අදියරෙහි කාර්යයන් අවසන් කර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමෙන් අපේක්ෂා කරන ලද ඉලක්ක ලබා කර ගත නොහැකි වී.තිබුණි | මෙම ව්‍යාපෘතිය කාලීන අවශ්‍යතාවයක් පදනම් කරගෙන ක්‍රියාත්මක කරගෙන යනු ලබන ව්‍යාපෘතියක් බැවින් ප්‍රමාදයකින් තොරව අදාළ ඉලක්ක ලබා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | දෙවන අදියර ආරම්භයේදී ඇති වූ ප්‍රමාද තත්ත්වය, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් මඟින් සොයා ගත් උපායමාර්ග, නියමු පරීක්ෂා කිරීමට අවශ්‍ය වීම; නවක සිසුන් සඳහා පුළුල් ප්‍රජා සමාජ වටිනාකම් ප්‍රවර්ධනය කිරීම සඳහා මොඩියුලයක් සැකසීම සහ එය නවක සිසුන්ට හඳුන්වා දීමට අවශ්‍ය වීම යන කරුණු හේතු කොටගෙන මෙම දෙවන අදියරෙහි කාලය 2019 මාර්තු 01 දින සිට නොවැම්බර් 30 දින දක්වා මාස නවයක් (09) සඳහා දීර්ඝ කරන ලදී. |
| **(ඇ)** | ශ්‍රී ලංකා රජයේ හා සෞදි රජයේ ආධාර මත රු4 මිලියන.,ක වැය 077 වර්ෂයේ 2017 ඇස්තමේන්තුවක් ඇතිව 2020 කර දින ආරම්භ 24 ඔක්තොම්බර් වර්ෂයේ දෙසැම්බර් වනවිට නිම කිරීමට නියමිතව තිබුණු වයඹ විශ්වවිද්‍යාලීය නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා අනුමැතිය ලබා ගැනීම හා ව්‍යාපෘති සැලසුම් සකස් කිරීම ප්‍රමාදවීම සහ සකස් කරන ලද සැලසුම්වල අඩුපාඩු හේතුවෙන් තවදුරටත් සැලසුම් සංශෝධනය කිරීමට සිදුවීම හා උපදේශන සමාගම් පත්කිරීමට ප්‍රමාදවීම ආදී කරුණු හේතුකොට ගෙන ව්‍යාපෘති ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වීති බුණි. සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් ප්‍රසම්පාදන ලියවිලි පිළියෙළ කර අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි. | විදේශ ණය ආධාර හෝ ප්‍රදාන යටතේ ක්‍රියාත්මක වන විදේශ ආධාර ව්‍යාපෘති ආරම්භ කර ප්‍රමාදයකින් තොරව ව්‍යාපෘති කාලරාමුව තුළ අදාළ නිමකිරීම් ඉලක්ක ලබා කර ගැනීමට කටයුතු කළ යුතු වේ. | මෙම ව්‍යාපෘතියේ මාකඳුර හා කුලියාපිටියේ පිහිටි පරිශ්‍ර දෙක සඳහා උපදේශකයින් පත් කර ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු එම උපදේශකයින්ගේ උපදෙස්වලට අනුව කළ යුතු කටයුතු නිම කළ අතර 2019 සැප්තැම්බර්/ ඔක්තෝම්බර් මාස තුළ පැවති විශ්වවිද්‍යාල අනධ්‍යන සේවක වැඩ වර්ජනය නිසාත් විශ්වවිද්‍යාල තුළ ව්‍යාපෘතියේ වැඩ කිරීමට නොහැකි වූ බව. |

| | | | |
|---|---|---|---|
| **(ඇ)** | ශ්‍රී ලංකා රජයේ හා කුවේට් රජයේ ආධාර ඇතිව නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යාපීඨ ව්‍යාපෘතිය රු6617 මිලියන..ක මූලික වැය 5 වර්ෂයේදී 2016 ඇස්තමේන්තුවක් මත ආරම්භ කිරීමට නියමිතව තිබුණි. එහෙත් ව්‍යාපෘති කාර්යයන් ආරම්භ 2019 කිරීම මාද වී තිබූ අතර වැඩ දින දක්වා ප්‍ර 01 ජුනි 2021 නිම කළ යුතු දිනයමාර්තු දින 31 .දක්වා දින දීර්ඝ කර තිබුණි ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී865 මිලියන.රු . 5 ක් උපයෝජනය කර ව්‍යාපෘති කාර්යයන් අතුරින් වාහන මිලදී ගැනීමේ කාර්යය පමණක් අවසන් කර ඇතත්අනෙකුත් , ක් 25 ගතිය සියයටපෘති කටයුතුවල ප්‍රව්‍යා .වැනි ඉතා අඩු මට්ටමක පැවතුණි | ලෝක බැංකු ආධාර යටතේ ලබා ගත් ණය ආධාර තුළින් ව්‍යාපෘති ක්‍රියාත්මක කරවා ගැනීමේදී ඒවා කාලපමාවකින් තොරව වැඩකටයුතු කර අදාළ ඉලක්ක සපුරා ගැනීමට කටයුතු කළ යුතු වේ. | විවිධ හේතු මත ඇති වූ බාධක හේතුවෙන් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඉදිකිරීම් ආරම්භ කිරීම 2019 ජුනි මස 01 දින දක්වා ප්‍රමාද විය. මෙම ඉදිකිරීම් ප්‍රසම්පාදනයේ ස්වභාවය අනුව ඉදිකිරීම් කාලය සඳහා දින 720ක් වත් අවශ්‍ය වන අතර ඒ අනුව ව්‍යාපෘතියේ වලංගු කාලය 2021 මැයි 31 දින දක්වා දීර්ඝ කිරීමට සිදු විය. කෙසේ වුව ද වර්තමානයේදී මෙම ව්‍යාපෘතිය ඉතා කඩිනමින් කාර්යයන් සිදු කරනු ලබන ව්‍යාපෘතියක් බව. |

## 3.8 ව්‍යාපෘතිය නියමිත දින ආරම්භ කර නොතිබීම.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා රජයේ හා ඉන්දීය රජයේ ප්‍රතිපාදන යටතේ රු335 මිලියන..ක වැය 7 ඇස්තමේන්තුවක් මත මඩකලපුව ස්වාමි විපුලානන්ද සෞන්දර්ය ආයතනය සඳහා ගොඩනැගිලි සංකීර්ණයක් ඉදිකිරීමේ හා 2018 පෘතියගැනීමේ ව්‍යා වාහන මිලදී වර්ෂයේ ආරම්භ කර සමාලෝචිත වර්ෂයේදී අවසන් කිරීමට නියමිතව තිබුණි. එහෙත් උපදේශක ආයතනය සමග ගිවිසුම් අත්සන් කිරීමේ කටයුතු දින දක්වා 12 ජූලි 2019 .තිබුණි මාද වීප්‍රඑබැවින් සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ව්‍යාපෘතියේ කටයුතු මූලික ප්‍රසම්පාදන අවස්ථාවේ පැවතුණි. | ව්‍යාපෘතිය නිශ්චිත කාලරාමුව තුළ නිම කර ඉලක්ක සපුරා ගත යුතු වේ. | 2019 වර්ෂය තුළ උද්ගත වූ විවිධ හේතු නිසා උපදේශක සමාගමක් තෝරා ගැනිමේ කටයුතු ප්‍රමාද විය.<br><br>අමාත්‍යාංශය විසින් කරන ලද ස්ථානීය පරීක්ෂාවේදී නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සුදුසු බව යෝජනා කර ඉන්දීය රජය ද එකඟ කර ගැනීමෙන් පසු මුළු පිරිවැය සමාලෝචනය කොට ප්‍රසම්පාදන කටයුතු සඳහා යොමු වූ බව. |

## 3.9 වත්කම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ------------------------ | ------------ | ------------------------------------- |
| (අ) | දිනැති යහපාලන 02 ජුනි 2003 8 ලේඛයේවක්‍ර.3.ඡේදයේ 9 තිපාදනයන්ට පටහැනි ලෙසප්‍ර අමාත්‍යාංශයට අයත් වාහන දෙකක් පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුවට දඑක් , වාහනයක් ජල සැපයුම් හා සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු ෘතිය සඳහාකිරීමේ ව්‍යාද මුදාහැර තිබුණි. | ආපසු ගෙන්වා ගැනීමට හෝ විධිමත් ලෙස පැවරීමට කටයුතු කළ යුතු වේ. | වයඹ පළාත් ප්‍රධාන ලේකම් විසින් කරන ලද ඉල්ලීමට අනුව අමාත්‍යාංශ ලේකම්තුමාගේ අනුමැතිය ඇතිව වාහන ලබාදීම සිදුකර ඇති බවත් අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යාපෘතියක් බැවින් කුලී පදනම මත වාහන ලබාගැනීම වෙනුවට අමාත්‍යාංශයේ භාවිතයට නොගන්නා KB-2442 අංක දරන වාහනය ව්‍යාපෘති රාජකාරී කටයුතු වෙනුවෙන් ලබාදී ඇති බව . |
| )ආ( | විගණනය විසින් සිදු කල ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය වූ පරිදි මෝටර් රථ ජීප් රථයක් හා ,ක් 08 රෝද රථයක්ත්‍රිධාවනයට යොදා ගැනීමෙන් තොරව අමාත්‍යාංශ භූමියේ අනාරක්ෂිතව තබා තිබුණි. | ධාවනයට යොදා නොගන්නා වාහන අලුත්වැඩියා කිරීමට හෝ ඉවත් කිරීමට පියවර ගත යුතු වේ. | 2018 වර්ෂයේ අපහරණ ක්‍රියාවලිය යටතේ වෙන්දේසි සඳහා යොමු කලද වාහන 03 ඉල්ලුම්කරුවන් නොමැති වීම හේතුවෙන් වෙන්දේසි නොවූ බවත් මෙම වසරේදී අපහරණ ක්‍රියාවලිය යටතේ භාවිතයට නොගන්නා වාහන පරීක්ෂා කර වෙන්දේසි කිරීම සඳහා අවශ්‍ය කටයුතු කරගෙන යනු ලබන බව. |
| )ඇ( | අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂය තුළ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සතු වාහන ,ක් ද 05ව්‍යාපෘති 02 කට අයත් වාහන 04 ක් ද වෙනත් , අමාත්‍යාංශ අටකට අයත් වාහන ක් හා 12ලේකම් කාර්යාලයට අයත් වාහනයක් ද වශයෙන් වාහන ක් පරිහරණය කරන 22 .බව අනාවරණය විය | විධිමත්ව පවරා ගැනීමට හෝ අදාළ ආයතනවලට මුදා හැරීමට කටයුතු කළ යුතු වේ. | අමාත්‍යාංශයේ අමාත්‍යවරයා හා ලේකම්වරු විශ්‍රාමයාමෙන් පසුව මෙම අමාත්‍යාංශයට භාරදෙන වාහන නිළධාරීන් භාවිතයට ගැනීමත් අළුත් වාහන මිලට ගැනීමට ප්‍රතිපාදන නොමැති බැවින් හා කුලී පදනම මත වාහන ලබා ගැනීමට වඩා අමාත්‍යාංශය යටතේ ඇති මණ්ඩලයේ හා ව්‍යාපෘතිවල වාහන භාවිතයට ගැනීම ආර්ථික වශයෙන් වාසිදායක බව. |

**3.10 රජයේ නිලධාරීන් ඇපතැබීම**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 128 (1) (ගකාරව ඇප තැබීමට බැදී සිටින ප්‍ර ( නිලධාරීන් එවකටවලංගු නීතිය හා නියමයන් අනුව ඇප තැබිය යුතු වුවද එසේ ඇප තබා නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ . | එකඟවෙමි. |

**3.11 වෙනත් නිරීක්ෂණ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1. වගන්තිය ප්‍රකාරව උසස් අධ්‍යාපන අංශයේ සිදුකර තිබූ කාර්යාල අළුත්වැඩියා කිරීමට අදාළ ත වියදම් සම්පාදනය සඳහා සියළු ආශ්‍රිප්‍ර පිරිවැය ඇස්තමේන්තුවක් ඇතුළු මුළු මාණපත්‍රපිළියෙළ කළ යුතු වුවද ප්‍ර අයිතම හා අදාළ රේටයන් දැක්වෙන පරිදි විස්තරාත්මක මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙළ කර නොතිබුණි. එම රේටයන් හා ටමාණයන් තීරණය කිරීමප්‍ර ත්කරුවා වෙත අවස්ථාව කොන්ත්‍රා ලබා දී තිබුණි | ප්‍රසම්පාදන කාර්යයන් ඉටුකිරීමේදී ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කළ යුතු වේ. | උක්ත කාර්යය ගොඩනැගිලි ඉදිකිරීම් ගණයට අයත් නොවන අතර ඉදිකර ඇති ගොඩනැගිල්ලක **interior** සකසා ගැනීමක්වේ. මේ සඳහා සම්මත අයිතමයන් හෝ සම්මත **Rates** නොපවතී. එනමුදු දළ විස්තරාත්මක ඇස්තමේන්තුවක් සකස් කර ඇත. එහි **Brief Description, Quantity, Unit, Rate, Amount** සඳහන් කර ඇත. |

## 4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දිනැති අංක 14 අගෝස්තු 2017 /එස්ඩීජී/එස්පී/එන්පී17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර ය න්‍යාය 2030 පන අංශයට කාරච උසස් අධ්‍යාය ප්‍රපත්‍ර අදාළවන කරුණු කිහිපයක් කෙරෙහි තිබූ ශයේ අවධානය යොමු වීඅමාත්‍යාං අතර සමාලෝචිත වර්ෂයේදී අදාළ ඉලක්ක තුළින් එම චක්‍රලේඛයේ 4. 3 වගන්තිය යටතේ වූ යෝජනාවල භෞතික ප්‍රගතිය සියයට ක පහළ මට්ටමක 50 .පැවති බව නිරීක්ෂණය විය | තිරසාර සංවර්ධන අරමුණු ඉලක්ක ලඟා කර ගැනීම සඳහා අමාත්‍යාංශයේ කටයුතු මෙහෙයවිය යුතුය. | පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම යටතේ ඇතුළත් වූ සිසුන් සංඛ්‍යාවේ වර්ධනයක් පෙන්නුම් කිරීමත් ජාතික උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (**SLIATE**) මඟින් උසස් අධ්‍යාපන අවස්ථා ලබාදීමත් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (**UGC**) යටතේ පවතින ජාතික විශ්වවිද්‍යාල සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමත් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමත් අමාත්‍යාංශය විසින් ඉටුකරනු ලැබ ඇති බව. |
| (ආ) | අමාත්‍යාංශයේ තිරසාර සංවර්ධනය අරමුණක් ලෙස පිරිසිදු ජලය සහ සනීපාරක්ෂාව සැපයීම හඳුනාගෙන තිබූ අතර සංවර්ධනය තුළින් නල ජලය සැපයීම ක්‍රියාත්මක කිරීම හා මලප්‍රවාහන හා ප්‍රතික ප්‍රතිචක්‍රීකරණය )Septage treatment) ක්‍රියාත්මක කිරිමට ඉලක්කගත කර තිබුණි. එමෙන්ම සැමට ආරක්ෂිත පානීය ජලය හා සනීපාරක්ෂාව , දර්ශක ලෙස ද දක්වා තිබුණිතිරසාර . සංවර්ධන අරමුණු හා ඉලක්ක කරා ළඟාවීම සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන පාර්ශවයන්ද හඳුනාගෙන ඇති අතර ඒ අය සඳහා වැඩසටහන් මගින් ද දැනුවත් කිරීම් සිදු කර තිබුණි. කෙසේ වෙතත් මේ සම්බන්ධයෙන් කිසිදු චක්‍රලේඛයක් මේ වන විට නිකුත් කර නොතිබුණි. | තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් නිකුත් කළ යුතු චක්‍රලේඛ නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. | මේ සම්බන්ධයෙන් වන ඉලක්ක , දර්ශක හා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන ඇති බවත් ජන හා ලේඛන දෙපාර්සංඛ්‍යාතමේන්තුව සමග වර්ෂයේදී වැඩසටහන් 2019 හා දැනුවත් කිරීම් සිදු කර ඇති 22 ජූනි 2020 බවත් ලේකම්ගේ 01 දිනැති හා අංක/02/04(V) දරන ලිපිය මගින් දන්වා ඇත. |

**5.** **මානව සම්පත් කළමනාකරණය**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව කාණ්ඩ 04 ක් යටතේ වර්ග කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වනවිට එම කාණ්ඩ 04 ට අදාළව පුරප්පාඩු 77 ක් පැන නැගී තිබුණි. එසේ වුවද එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය විසින් රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය අවස්ථා කිහිපයකදී දැනුවත් කර තිබුණ ද 2020 ජුනි අවසන් වනවිට උපාධිධාරී අභ්‍යාසලාභීන් 36 දෙනෙකු පමණක් අනුයුක්ත කර තිබුණි. ඉතිරි පුරප්පාඩු පිරවීමට කටයුතු කර නොතිබුණි. | කාර්යමණ්ඩල අත්‍යාවශ්‍ය පුරප්පාඩු නියමිත කාලය තුළ සම්පූර්ණ කර අමාත්‍යාංශයේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායී අයුරින් කරගෙන යාමට කටයුතු කළ යුතුය. | 2020 ජුනි මස අවසන් වන විට පුරප්පාඩු සංඛ්‍යාව 67ක් පමණක් වන අතර අනෙකුත් පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය දැනුවත් කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂය වන විට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් තනතුරු කට අයත් 07 සිට 1 දෙනෙකු අවුරුදු 18 සේවකයන් ක කාල පරාසයක සිට 5 මාස 5 අවුරුදු නගර සැලසුම් හා ජල සම්පාදන ශයේ සේවය කරන බව අමාත්‍යාං තොරතුරු අනුව .නිරීක්ෂණය වියඉන් සේවකයන් දෙනෙකු වෙනුවෙන් 15 වැටුප්සේවක අර්ථ සාධක ,දීමනා , හා සේවක භාරකාර අරමුදල් සඳහා මණ්ඩලය විසින් එකතුව රු.මිලියන 17. ක් 5සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණු අතර එම මුදල මණ්ඩලයට ප්‍රතිපූර්ණය කර නොතිබුණි . | වෙනත් පාර්ශවයන්ගෙන් ලබා ගත් මානව සම්පත් අදාළ ආයතන වෙත නිදහස් කළ යුතුය. | පුරප්පාඩුක් පවතින නිසා 47 ජාතික ජල සම්පාදන දෙනෙකුගේ 19 මණ්ඩලයේ සේවය ලබා ගැනීමට සිදුව .ඇත අමාත්‍යාංශයේ දැනට පවතින පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමේදී ඔවුන්ව නිදහස් කිරීමේ හැකියාව ඇති බව. |